ඈ) ආර්ථික සේවා ගාස්තුව

ඇ) බැංකු හා මූල්‍ය ආයතනයන් මත පැනවෙන හර බද්ද

ඉ) කොටස් වෙළඳපළ මත පැනවෙන ප්‍රාග්ධන ලාභ බද්ද

ඊ) සහාධිපත්‍ය දේපළ මත පැනවෙන වැට් බද්ද

උ) උපයන විට ගෙවීමේ ආදායම් බද්ද

ඌ) පොළී ආදායම මත පැනවෙන රඳවා ගැනීමේ බද්ද සහ අනෙකුත් මාදිලියේ රඳවා ගැනීමේ බදු

එ) ණය සේවා බද්ද

4.0 විශේෂ භාණ්ඩ සහ සේවා බද්ද ක්‍රියාත්මක කිරීමේ දී මත්පැන්, දුම්වැටි, විදුලි සන්දේශ සේවා, මෝටර් රථ, විනෝදාත්මක කාර්යයන් ආදිය මත ක්‍රියාක්මක කෙරෙන විවිධ බදුකරණ විධිවිධාන සහබද්ධ කිරීම තුළින් එකී තනි පාරිභෝගික භාණ්ඩ හෝ සේවාවන් අදාළ ව්‍යවස්ථාවන් යටතේ නියාමන අධීක්ෂණයට යටත්ව මාර්ග ගත බදු පරිපාලනය හරහා හැසිරවීමට කටයුතු යෙදීම.

5.0 රේගු අය ක්‍රමය සුවිධානය කිරීමට අදාළව කෘෂි ව්‍යාපාර, ස්වභාවික සම්පත්, ආරක්ෂාව, සෞඛ්‍ය සහ තත්ත්ව ප්‍රමිතීන් මත සෘණ ලැයිස්තුවක් හඳුන්වා දෙනු ලැබිය හැකිය. වාරික කෘෂි හා අනෙකුත් ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු පිණිස එබදු අයිතමයන් සඳහා රේගු පොළේදී තනි බද්දක් භාවිතයට ගනිමින් විශේෂ වෙළඳ අය කිරීමක් හා සෙස් බද්දක් පවත්වා ගනු ලබනවා ඇත.

6.0 තේ, ගම්මිරිස්, සකස් නොකළ ස්වභාවික තත්ත්වයේ රබර්, කුරුඳු සහ කෘෂි වෙළඳ භාණ්ඩ ගණනාවක් සහ අනෙකුත් දේශීය වශයෙන් සැකසෙන කුඩා කාර්මික නිෂ්පාදන ආනයන තරඟකාරීත්වයෙන් ආරක්ෂා කරන බවට මම ප්‍රතිඥා දෙමි: මේ අනුව, එකී අයිතමයන් සෘණ ලැයිස්තු ගත කිරීම හෝ ඉතා ඉහළ රේගු පාදක බදු වලට යටත් කිරීම නිර්දේශ කරමි.

7.0 කිසිදු අයුරකින් නිෂ්පාදනය නොකෙරෙන්නාවූත් රටට ඵලදායී වූත් අයිතමයන්ට ගෝලීය ප්‍රභවයන් වෙත ප්‍රවේශවනු පිණිස තීරු බද්දෙන් නිදහස් කෙරෙනු ඇත. නවීන තාක්ෂණය යොදා ගනිමින් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය නොකෙරෙන යන්ත්‍රසූත්‍ර හා උපකරණ තීරු බද්දෙන් නිදහස් කෙරෙනු ඇත. විවිධ වෙළඳ ගිවිසුම් යටතේ අය කෙරෙන වරනීය බදු අනුපාතිකය එකී වෙළඳ ගිවිසුම් ප්‍රකාර ජාතික අයිතිවාසිකම් හා බැදීම් සැලකිල්ලට ගනිමින් සමාලෝචනය කෙරෙනු ඇත. ඉහත දී හෝ කලින් නිශ්චිතව දක්වා ඇති අයිතමයන් හැර අනෙකුත් අයිතමයන් මත පැනවෙන සම්මත රේගු තීරු බදු අනුපාතිකය 15% ක මට්ටමෙන් පවත්වා ගනු ලබනවා ඇත.

8.0 මෙම තත්ත්වයන් තුළ ජනතාව වෙත මා පොරොන්දු වී ඇති නව බදු ක්‍රමය නිර්මාණය කිරීමේ මෙම යෝජනාවන් ක්‍රියාත්මක කරනු පිණිස මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාරම්භ කිරීම යෝග්‍ය වනු ඇත.

9.0 එසේ වුවද ප්‍රමුඛතා කරුණක් වශයෙන් අදාළ බදු අණපනත් වල සංශෝධනයන්ට පාර්ලිමේන්තු අනුමැතිය ලැබෙන තෙක් මතු දැක්වෙන ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීම මම නිර්දේශ කරමි.

i. භාණ්ඩ හා සේවාවන් මත පනවනු ලබන 15% ක වැට් බද්ද සහ 2% ක ජාතිය ගොඩනැගීමේ බද්ද වෙනුවට 2019.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 8% ක බද්දක් අය කිරීම.

ii. බැංකුකරණය, මූල්‍ය සේවා සහ රක්ෂණය මත පනවනු ලබන වැට් බද්ද 15% ක මට්ටමින් පවත්වාගෙන යාම සහ එබදු සේවාවන් මත පැනවෙන ජාතිය ගොඩනැගීමේ බද්ද ඉහත අංක i හි යෝජනාවත් සමඟ ඉවත් කරලීම.

iii. වැට් බද්ද සඳහා වන පිරිවැටුමට අදාළ බද්දෙන් නිදහස් ප්‍රවේශය මසකට රු. මිලියන 1 සිට මසකට රු. මිලියන 25 දක්වා හෝ වර්ෂයකට රු. මිලියන 300 දක්වා ඉහළ නැංවීම සහ ඒ සමඟම ආර්ථිකයෙහි සියලුම අංශයන් හි විශේෂයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරයන්ට ක්ෂණික සහනයක් සලසාලනු පිණිස ඉහත අංක i හි යෝජනාව ක්‍රියාත්මක කිරීම.

iv. පිරිවැටුමෙන් 60% ක් දේශීය සැපයුම් වලින් ප්‍රභවය ලැබෙතොත්, සංචාරක කර්මාන්තය අවම අගයක් සඳහා වන අපනයනයක් ලෙස සැලකීම. දේශීය කෘෂිකර්මාන්තයටත් දේශීය වශයෙන් කෙරෙන නිෂ්පාදන ව්‍යාපාරයන්ටත් සංචාරක කර්මාන්තය වාසිදායක වනු ඇත.

v. ඉදිකිරීම් කර්මාන්තය 28% ක අදායම් බද්ද වෙනුවට 14% ක ආදායම් බද්දක් මත පිහිටවනු ලැබීම.

vi. හිතකර කාලගුණික තත්ත්වයෙන් ආශිර්වාද ලත් දැනටමත් ආරම්භ වී ඇති 2019/2020 මහ කන්නයෙන් උපරිම නිෂ්පාදනයක් අත්කරගනු පිණිස මත්ස්‍ය හා පශු සම්පත් වගාව ඇතුළු කෘෂි වගාවේ නිරත පිරිස් දිරිගැන්වීම සඳහා කෘෂිකර්ම, ධීවර හා පශු සම්පත් වලින් ලැබෙන වගා ආදායම්, අදායම් බද්දෙන් නිදහස් කිරීම.

vii. ආගමික ස්ථානයන් මත පනවනු ලැබූ බද්ද 2019 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීම.

viii. 2020 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සඳහා දැනට මසකට රු.125,000.00 උපරිමය සඳහා අයකෙරෙන බද්ද වෙනුවට රු. 250,000.00 ක සියල්ල අඩංගු මාසික ආදායමක් මත එකී ඉපයීම් උපයන විට ගෙවීමේ බදු වලින් ඉවත් කිරීම.

ix. රු. 250,000.00 ට අඩු මාසික පොලී ආදායම සඳහා පොලී ආදායම මත අය කෙරෙන රඳවාගැනීමේ බද්ද ඉවත් කිරීම.

x. කුමන හෝ ආදායම් ප්‍රභවයක රු. 250,000.00 ට වැඩි මාසික ආදායම, සෑම රු. 250,000.00 ක බදු කණ්ඩයක් සඳහා 6%, 12%, 18% යන අනුක්‍රමික අනුපාතිකයන් මත පුද්ගල ආදායම් බදු ගෙවීමට යටත් වනු ඇත.

xi. වෘත්තීමය සේවාවන් සපයමින් විදේශීය විනිමය උපයනු ලබන ශ්‍රී ලාංකිකයින්ගේ විදේශ විනිමය ඉපයීම් 2019 දෙසැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බදු වලින් නිදහස් කිරීම.

xii. තොරතුරු තාක්ෂණය සහ සඵල සේවාවන් සියලුම බදු වලින් නිදහස් කිරීම.

xiii. විදුලි සන්දේශ බද්ද 25% කින් අඩුකරලීම.

10.0 යෝජිත ක්‍රියාමාර්ග ගැනීම තුළින් රාජ්‍ය ආදායමෙහි යම් අඩුවීමක් ඇති වීමට අවකාශ ඇත. එසේ වුවද බදු ක්‍රමය යළි සකස්කරලීම නිසා අපේක්ෂිත ප්‍රතිලාභයන් තුළින් රාජ්‍ය ආදායම යළි ප්‍රකෘති තත්ත්වයට පත් වනු ඇත.

11.0 මගේ මූලික ප්‍රමුඛතාව වනුයේ ආර්ථිකය යළිත් ප්‍රකෘති තත්ත්වයට පත්කරලීමය. මේ සඳහා 2019/ 2020 මහ කන්නය සුභදායී ආරම්භයකි. මෙම ක්‍රියාවලියෙහිලා විශ්වාසය ගොඩනැගීමේ බදු පිළිවෙත සහ කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණය ගාමක බලවේගය වනු ඇත. යෝජිත බදු ක්‍රියාමාර්ගයන් තුළින් සමස්ථ මිල පහත වැටීමටත්, ව්‍යාපාරයන්ට හිතකර ආර්ථික වාතාවරණයක් ගොඩනැගීමටත් මංපෙත් විවර වනු ඇත.

12.0 රජයේ ආදායම යළි සකසාලීමට යම් කලක් ගතවනු ඇති බැවින් මූල්‍ය අසමතුළිතතා කළමනාකරණය කරගනු පිණිස රජයේ මුදල් වැය කිරීමේ දී සීරුවෙන් කටයුතු කිරීම අවශ්‍ය වන්නකි. එබැවින් වාහන, ගමන් බිමන්, ගොඩනැගිලි, පහසුකම් ආදිය වෙනුනවන් කෙරෙන වියදම් ඇතුළුව සියලුම අත්‍යාවශ්‍ය නොවන සහ ප්‍රමුඛතා පාදක කොට නොගත් වියදම් කපාහැරීමට සියලුම රේඛීය අමාත්‍යාංශයන් සහ නියෝජිත ආයතනයන් වෙතින් මම උදක්ම ඉල්ලීමක් කරනු කැමැත්තෙමි. භාණ්ඩ සහ සේවාවන් මත පැනවෙන බදු වඩා අඩුවීමට ඉඩ ඇති බැවින් අර්ධ රාජ්‍ය නියෝජිත ආයතනයන් සහ රජයට අයත් ව්‍යවසායන් මඟින් කෙරෙන වියදම් ඇතුළු රජයේ වියදම් ද පහත මට්ටමක පවත්වා ගත යුතුය.

13.0 එබැවින් මෙම වැඩසටහන ක්‍රියාවට නංවාලනු පිණිස නිසි පියවර ගන්නා මෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන ගරු අමාත්‍යවරයා වෙතින් මම ඉල්ලීමක් කරනු කැමැත්තෙමි.

**ගෝඨාභය රාජපක්ෂ**
ජනාධිපති

2019 නොවැම්බර් මස 26 වන දින